# බෞද්ධ භික්ෂූන් වහන්සේගේ නූතන සමාජයේ සඞ්කේතාත්මක භූමිකාව හා සමාජ හැසිරීම පිළිබඳ අධ්‍යයනයක්

යූ. කේ. ආර්. එස්. පී. විජේසිරි[1], පූජ්‍ය, උල්පතගම අමිතරතන හිමි[2]

## හැඳින්වීම

බෞද්ධ භික්ෂුව යනු සිංහල මහා සංස්කෘතිය තුළ සුවිශාල ඉඩ ප්‍රස්ථාවක් හිමි කරගෙන ඇති සාධනීය පෞරුෂයකි. සමාජීය වෙනස්වීම් හා වෙනස් කිරීම් හමුවේ ද බලවේගීය කාරණයකි. එය සිංහල ලාංකේය ඉතිහාසයේ දෙදහස් ගණනක් ඈත එපිටට හැරී බැලුව ද වෙනසක් නොමැති ව දක්නට ලැබෙන්නකි. "**ගමයි, පන්සලයි, වැවයි, දාගැබයි, නිල් ගොයමයි, කහ සිවුරයි**" යන්නෙන් අවිච්ඡින්න වූ බැඳීමේ තරම පැහැදිලි ය. අතීතය, වර්තමානය ආදී කුමන කාලයක දී වුව ද පාලකයන් සිය පාලන කටයුතු කෙරෙහි උපදෙස් මඟ පෙන්වීම් ලබා ගැනීමට භික්ෂූන් පෙරමුණේ තබා ගත් බව නො රහසකි. එහි නෂ්ටාවශේෂ අද ද ඉතිරි ව ඇති බව පාලන තන්ත්‍රයට හා පාලකයන් කෙරෙහි භික්ෂූන් වහන්සේලා දක්වන මැදිහත් වීමෙන් පැහැදිලි ය. බෞද්ධ කුටුම්බ ජීවිතයක දරු උපතකට පෙර බෝධිපූජාවන්, පිරිත් සජ්ඣායනය, උපත හා ඉඳුල් කටගෑම, අකුරු කියවීම, විවාහය, මරණය ආදී ජීවිතයේ සෑම සියලු හැරවුම් ලක්ෂයන් වල දී ද පන්සල හෝ භික්ෂූන් වහන්සේලා සම්බන්ධ වීම දක්නට ඇත. දරුවන් වැලි පිල්ලෑවේ අකුරු නො කළ ද කඩයිම් විභාගයකට මුහුණ දීමට ආශීර්වාද බෝධිපූජා, පිරිත් නූල්, පිරිත් පැන් පමණක් නො ව සෙත්කවි, සෙත්පිරිත් ද ආශීර්වාදය පොවන, කවන, ජීවම් කරන ලද පැන්, පැන්සල් ද පන්සල මූලික කරගෙන ලබා ගනී. පන්සල ද භික්ෂුව ද මිනිසුන් තුළ අද්විතීය ස්ථානයක ලැගුම් ගෙන ඇත්තේ එසේ ය. අද්‍යතනයේ කුමන හෝ සමාජ සංස්ථාවක අරගලයක දී හෝ ගැටලුවකට මැදිහත් වීමක දී ද මුලසුන ගෙන ක්‍රියා කරන්නේ භික්ෂූහු ම වෙති.

## පර්යේෂණ අරමුණ

සමාජ විපර්යාස හමුවේ බෞද්ධ භික්ෂුවගේ භූමිකාවේ සඞ්කේතාත්මක අගයේ විවිධ වෙනස්වීම් ඇති වී තිබේ ද යන්න අධ්‍යයනය කිරීම මෙහි අරමුණ වේ.

## පර්යේෂණ ක්‍රමවේදය

බෞද්ධ භික්ෂූන් වහන්සේගේ සඞ්කේතාත්මක භූමිකාව හා සමාජ හැසිරීම පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රාථමික මූලාශ්‍රය හා ද්විතීයික මූලාශ්‍රය භාවිතයට ගන්නා ලදී. පුස්තකාල පරිශීලනය හරහා ලබා ගත් ග්‍රන්ථ ආශ්‍රය කරගනිමින් ලබා ගත් තොරතුරු මඟින් මෙම ලිපිය සම්පාදනය කිරීමට අවශ්‍ය වූ තොරතුරු සපයා ගන්නා ලදී. ඊට අමතර ව අනාකෘතිමය සම්මුඛ සාකච්ඡා කිහිපයක් විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ නිරත සාමණේර භික්ෂූන් වහන්සේලා දස නමක් සමඟ පැවැත් වූ අතර, එයින් ලැබූ ගුණාත්මක දත්ත විග්‍රහාත්මක හා තුලනාත්මක අධ්‍යයනයන් හරහා විස්තරාත්මක ව ඉදිරිපත් කරනු ලැබී ය. භික්ෂූන් වහන්සේලා සතු සඞ්කේතාත්මක භූමිකාව වෙනස් වීම අධ්‍යයනය කිරීම ප්‍රමුඛකොට

[1]. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, භික්ෂු විශ්වවිද්‍යාලය. *pradeepikalk@gmail.com*
[2]. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, භික්ෂු විශ්වවිද්‍යාලය. *uamitha@gmail.com*

විවරණාත්මක පර්යේෂණ කාණ්ඩය යටතේ සිදු කරනු ලබන මෙම පර්යේෂණය මගින් භික්ෂූන් වහන්සේලා සතු අතීත හා වර්තමාන භූමිකාවන්ගේ සඞ්කේතාත්මක ලක්ෂණයන් සහ ඒවායේ ඇති වැදගත්කම සංසන්දනාත්මක ව විශ්ලේෂණය කර ඇත. භික්ෂූන් වහන්සේලා සමඟ සාකච්ඡා කොට ලබාගත් විශ්වාසදායක තොරතුරු මත පදනම්ව මෙම පර්යේෂණයෙන් ලබා ගත් විශ්ලේෂිත දත්තයන් ආශ්‍රයෙන් පර්යේෂණ නිගමනයන් හා යෝජනාවන් ඉදිරිපත් කර ඇත.

**පර්යේෂණ ගැටලුව**

විවිධ සමාජ සංසිද්ධි හා සමාජ සංස්ථාවල ක්‍රියාකාරීත්වය නිසා භික්ෂූන් කෙරෙහි ප්‍රතිරෝධී අදහස් හා විවේචන එල්ල වී ඇත්තේ ඇයි? යන්න ගැටලුව ලෙස තෝරා ගන්නා ලදී.

**පර්යේෂණ සාකච්ඡාව**

නූතන මාධ්‍ය සංස්කෘතියේ එෆ්.එම්. හා රූපවාහිනී නාලිකා තුළ බණට පිරිතට සෙත්කවියට බෝධිපූජාවට හොඳ ම හා ප්‍රසිද්ධ භික්ෂුවක් තෝරා ගැනීමට අනවරත තරඟයක නිරත වේ. සමහර ඒවායේ ඒකාධිකාරී භික්ෂු ආධිපත්‍යයකි. නූතන නො හික්මුණ ජනමාධ්‍ය තම න්‍යාය පත්‍රය ජනප්‍රිය රැල්ලට ගෙන එනු වස් නො කරන යමක් නැති විට එය භික්ෂූන් අරබයා ද එසේ නො වෙතැයි කිව නො හැකි ය. විශේෂයෙන් සමාජ විප්ලව හා සඞ්කල්ප සමාජගත කිරීමට ප්‍රසිද්ධ ස්ථානවල ගිණි තබා ගැනීම ද උපවාස උද්ඝෝෂණ සඳහා පෙරගමන් ගන්නා භික්ෂූන් ද සුලභව දක්නට ලැබේ. කහ සිවුරට හිමි වටිනාකම ගරුත්වය මැදිහත් වීමේ ඉඩකඩ හා නම්‍යශීලීත්වය ඇති ඉහළ පිළිගැනීම නිසා ඔවුන්ට උක්ත කාරණා කෙරෙහි මැදිහත් වීමට ඇති හැකියාව ද ඉහළ ය. දේශපාලන සංස්ථාව තුළ ද භික්ෂුව වැඩි බරක් උසුලන අතර, එම භූමිකාව කෙතරම් කාර්යසාධක ද? යන පැනය උද්ගත ව ඇත. විටෙක දේශපාලන හැසිරීමේ විකට ස්වරූප මත සමාජ සෝපාහාසයට ද අතීතයේ අල්පේච්ඡ වූ භික්ෂූන් බහුභාණ්ඩික වී මහේශාක්‍ය ජීවිත ගත කිරීම නිසා ද සමාජ විවේචනයන්ට ලක්ව ඇත. සෑම ප්‍රවර්ගයකට ම අයත් බලාධිකාර ව්‍යූහ පිරිහීමකට පත්වෙමින් තිබෙන වකවානුවක සාම්ප්‍රදායික බලාධිකාර ව්‍යූහයේ ම අඞ්ගයක් වන සඞ්ඝ සමාජය ඒ හැටියේ ම ජනතාව අද පිළිගන්නවා ද? යන පැනය උද්ගත වේ. සම්භාව්‍ය ඉන්දියානු බුද්ධාගමට අනුව භික්ෂූන් වහන්සේ වූ කලී ඉතා ශක්තිමත් විමුක්තිදායක මාර්ගයක් අනුගමනය කරන්නෙකි. වෙබර් දක්වන ප්‍රසිද්ධ නිර්වචනයක බුද්ධාගම යනු භික්ෂු චර්යාවේ නියැලෙන ශ්‍රමණයන්ගේ විමුක්ති මතවාදයක් ලෙස දැක්වේ. නමුත් නූතන සිංහල බුද්ධාගමේ තත්ත්වය අනුව නම් සමාජ දේශපාලන සංස්ථා තුළ භූමිකා නිරූපණය ඉටු නො කරන අල්ප වනවාසී භික්ෂු ප්‍රජාව හැරුණු කොට අනෙකුත් භික්ෂූන් එකී සුවිශාල කුලකයේ කොටස්කරුවෝ ය. නව යෞවනයට එළැඹීමට පෙර දෙමාපිය බලපෑම, ආර්ථික දුෂ්කරතා හා දරිද්‍රතාව වැනි කාරණා නිසා සිවුරු ලා භික්ෂුත්වය ලබා ගත්ත ද විමුක්තිය සෙවීම වෙනම ම මාර්ගයක් බව නො කියමනා ය. ගැමි සමාජයේ සුළු ඉඩම් හිමි බොදුජන පසුබිමකින් පැමිණෙන හෝ අති දරිද්‍රතාවකින් පෙළෙන ජීවත්වීම කටුක පසුබිමකින් හෝ මුදල් අමාරුකම්වලට නිරතුරු ව ම මුහුණ දෙන මෙම දරුවන්ට සාමණේර භික්ෂුවක් වීම යනු සමාජ සඵලතාව අත්පත් කර ගැනීමකි. උසස් අධ්‍යාපනය හෝ උපාධි ලබා ගැනීමේ ප්‍රස්ථාවකි. ජ්‍යෙෂ්ඨ ගුරු භික්ෂුව සමඟ සේ ම පවුලේ උදවිය සමඟ ද නිරන්තර ව සබඳතා පවත්වන පිරිස් වන අතර, බැඳීම් ක්ෂය

කිරීම සිදුවීම අල්ප ය. කිසියම් ප්‍රමාණයකින් අධ්‍යාපන සුදුසුකම් ලැබූ පසු සාමණේර භික්ෂූන් බොහෝ දෙනා මහණකම අතහැර නැවත ගිහිගෙට පැමිණෙන අතර, සිවුර හැර යන පිරිස නිසා ඇති වන රික්තකය පිරවීමට ළමා පිරිමින් මහණ කරවීමට ගුරු භික්ෂූන් වහන්සේලා සැදී පැහැදී සිටිති. විමුක්තිමාර්ග වෙනුවට පවතින සටන්කාමී සිංහල බුද්ධාගම තුළ සඞ්ඝයා වහන්සේ අතිශයින් සඞ්කේතාත්මක භූමිකාවක් රඟ දක්වති. විමුක්තිමාර්ගය ගවේෂණය උදෙසා ගිහි සමාජය හැර දැමූ සඞ්ඝයා වහන්සේ වෙනුවට සිංහල ජාතිකවාදය මහෞෂධය කොටගත් සිංහල ජාතිකවාදී මතධාරීන් පිරිසක් එකී මතවාදය අව්‍යක්ත අයුරින් පතුරුවන පිරිසක් බවට පත්වී සිටිති. පංතිභේදයකින් තොර ව සිංහල බෞද්ධ ආගමේ "සදාචාරමය ප්‍රජාවක්" ලෙස භික්ෂුව ලේබල් කර ගනිමින් එම මතවාදය ගිහියන්ට පිළිගැනීමට ඉඩ සලස්වා ඇත. නමුත් බහුතරයක් භික්ෂූන් වහන්සේලා විවිධ කුල, නිකායන්ට හා ධුරාවලී මට්ටම් අනුව බෙදී ගිය විෂමජාතීය ප්‍රපංචයක් බව හඳුනා ගැනීමට හැකි ය. භික්ෂු සමාජය ක්‍රමයෙන් පුළුල් වෙමින් ව්‍යාප්ත වන්නට පටන් ගත් විට ශ්‍රමණ සාරූප්‍යයට අනුරූප නො වන භික්ෂු ආකල්පයට නො ගැළපෙන ක්‍රියාවන් භික්ෂූන් අතින් සිදු වන්නට වීමත් සමඟ සමාජ ප්‍රශ්න කිරීම් ද ඇති විය. නූතනයේ ජනප්‍රිය බුදුදහම සමඟ අනුගත වන තවත් භික්ෂූන් ආමිසපූජාවේ සැබෑ හරය අමතක කොට ප්‍රමාණාත්මක අලඞ්කාරාත්මක කාරණා මුදුන් පැමිණවීමට ක්‍රියා කිරීම දැකිය හැකි ය. ප්‍රමාණාත්මක අතින් අති විශාල පළතුරු පූජාවන් මල් පූජාවන් සිදු කරන්නේ ප්‍රසිද්ධ ව්‍යාපාරික ආයතනයන්ගේ දැන්වීම් ප්‍රචාරණයන් වෙහෙර විහාර භූමිය පුරා ප්‍රදර්ශනය කරමිනි. ආරාම, වෙහෙර, විහාර ඉදිකරමින් පුළුල් ව්‍යාප්තියක් ඇති කරමින් වෙන ම ම සඞ්කල්ප ඉස්මතු කිරීමට උත්සුක වන භික්ෂූන් සේ ම විවිධ මාර්ගඵල ලබා ගත් බව පවසමින් වෙනයම් මහේශාක්‍ය ජීවිත හරහා සුඛිත මුදිත ජීවනචර්යා ගෙන යමින් අනුගාමික පිරිස් වර්ධනයම ඉලක්ක කොට ගත් භික්ෂූන් ද හමුවේ. වර්ෂ 1956 වන විට භික්ෂූන් විසින් ඉටු කළ වැදගත් දේශපාලන භූමිකාව සුළු කොට තැකිය නො හැකි අතර, සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු, වශයෙන් සුවිශාල සමාජ බලවේගයන්ගේ එක් පුරුකක් වීම ම නො තකා හැරිය නො හැකි ය. ගැටලුව නම් අද වන විට එකී වැඩ කොටස වැනි යමක් කිරීමට තවදුරටත් ඉඩකඩ තිබේ ද? යන පැනය යි. එනම් එවක භික්ෂුත්වයට හිමි කාර්යසාධක ගුණය අද වන විට අභියෝගයට ලක්ව ඇති බව පැවසීමට හැකි ය. විවෘත ආර්ථිකය සමඟ වේගයෙන් හඹා ආ වාණිජකරණ ක්‍රියාදාමයන් තුළ සාම්ප්‍රදායික මිනිසා ද සාම්ප්‍රදායික මිනිස් ආකල්ප ද සාම්ප්‍රදායික සමාජ ව්‍යුහය ද පුළුල් වෙනස්කම් රැසකට භාජනය වී හමාර ය. එම වෙනස්කම් නිසා ම සාම්ප්‍රදායික බලාධිකාර ධුරාවලියේ සාමාජිකයෙකු වන භික්ෂුවගේ සමාජ තත්ත්වය සමාජ පිළිගැනීම ගිළිහෙන්නට විය. නමුත් නූතනයේ ජනවාර්ගික කාරණා වඩාත් වැඩි වශයෙන් ඉස්මතු වීමත් සමඟ නැවත භික්ෂූන්ට අහිමි වූ ස්ථානයට පත්වීමට ඉඩ ප්‍රස්ථාව ලැබී ඇත. ජාතිය අනතුරේ ඇති බවත් එය රැක ගැනීමට පෙරට ආයුතු බව යනාදී වශයෙන් වන මතවාද සමඟ භික්ෂූන්ට නැවත බලපෑම් කළ හැකි තත්ත්වයට පමුණුවා ඇත.

**පර්යේෂණ නිගමන**

අතීත සමාජය තුළ බලපෑම් එල්ල කිරීමේ ඉහළ ම හැකියාවක් ඇති පුද්ගල කණ්ඩායමක් ලෙස භික්ෂූන් වහන්සේට ඉතා ඉහළ ඉඩක් තිබූ අතර, විවිධ සමාජ විපර්යාස හමුවේ එය ගිලිහෙන්නට විය. නූතන විවෘත ආර්ථිකය සමඟ ගොඩනැගුණු සමාජයේ භික්ෂූන් වහන්සේලාගේ හැසිරීම් රටාවන් හා

ක්‍රියාකාරකම් නිසා ද විවිධ විවේචන හා මතවාදයන්ට මුහුණ දීමට සිදු විය. නමුත් විවිධ විවිධ සමාජ ගැටලු අබියස දී  සමාජ ප්‍රපංචයෙන් උරුම ව ඇති වටිනාකම හා ගෞරවය නැවත ලබා දීමට උත්සුක වන ආකාරය දැක ගැනීමට හැකි ය.

**ප්‍රමුඛ පදඃ** බෞද්ධ, භික්ෂුව, භූමිකාව, සඞ්කේතාත්මක

**මූලාශ්‍රය**


- අමුණුගම, සරත් (1977). **සංස්කෘතිය සමාජය හා පරිසරය.** කොළඹඃ ගුණසේන සහ සමාගම.
- සිල්වා, ප්‍රේමකුමාර (2008). **බුදුදහම රාජ්‍යය සහ භික්ෂු සමාජය සමාජවිද්‍යාත්මක අධ්‍යයනය.** සමාජ විද්‍යාඥයන්ගේ සඞ්ගමය.
- සේනාරත්න, පී. ඇම්. (2001). **ශ්‍රී ලංකාවේ සංස්කෘතික** දායාද. කොළඹඃ එස් ගොඩගේ සහ සහෝදරයෝ.
- Senevirathne, H. L. (1999). T**he Work of Kings:** the new Buddhism in Sri Lanka, London: The university Chicago Press Ltd.